# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1859/63 - 2014 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා - 2014.04.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්ඒ/2218.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, පිටබැද්දර ජල සම්පාදන ක්‍රමය යටතේ නිෂ්පාදන නළ ළිඳක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1024.

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොරකවෙල ග්‍රාම නිලධාරී වසමේ ගොරකවෙල ගමේ පිහිටි නරියවිලදෙනිය සහ ඕකන්ද නොහොත් නරියවිල ඕකන්ද නමැති ඉඩම් කොටස පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු පී. එස්. ස්ටීවන් මහතා විසින් පිළියෙල කරන ඇති අංක 705A දරන පිඹුරේ කැබලි අංක 13 ලෙස දැක්වෙන ඉඩමෙන් පර්චස් 05ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 28 ලෙස දැක්වෙන මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ගය ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මුරුකන් ඇල. |




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ආර්. උපුල් රංජීව මහතා,
ගමගෙදර වත්ත,
සියඹලාගොඩ - නැගෙනහිර,
පිටබැද්දර.

05-321

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මහනුවර හා තදාසන්න ජල සම්පාදන ව්‍යාපෘතියේ, කටුගස්තොට ජල පවිත්‍රාගාර සංකීර්ණයේ නිල නිවාස පිටුපසින් විකල්ප ප්‍රවේශ මාර්ගයක් ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1043.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 420, පොල්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කොන්ඩදෙනිය ගමේ පිහිටි, මුළු ප්‍රමාණයෙන් පර්චස් 03ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි "කැටකැල ගහ හේන නොහොත් කිරිවැල්ගොඩ හීන්න" නමැති ඉඩම් කොටස :

ඉඩමේ නම : කැටකැල ගහ හේන නොහොත් කිරිවැල්ගොඩ හීන්න
ප්‍රමාණය : පර්චස් 03
මායිම්

*උතුරට* : කොණ්ඩදෙනිය රජ මහා විහාරය හා ගාමිණී පාලිතරත්න හිමිකම් කියන ඉඩම හා නිවාසවලට යන මාර්ගය ;
*නැගෙනහිරට* : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා අත්කර ගත් ඉඩම (මු. පි. මහ 5398හි කැබලි අංක 26, 27 හා 29) ;
*දකුණට* : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා අත්කර ගත් ඉඩම (මු. පි. මහ 5398හි කැබලි අංක 26, 27 හා 29);
*බටහිරට* : කොණ්ඩදෙනිය රජ මහා විහාරය හා ගාමිණී පාලිතරත්න හිමිකම් කියන ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : 01. විහාරාධිපතින් වහන්සේ,
කොණ්ඩදෙනිය රජ මහා විහාරය,
කොණ්ඩදෙනිය,
කටුගස්තොට.

02. මහා භාරකාර තුමා,
මහා භාරකාර දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

03. ගාමිණී පාලිතරත්න මහතා,
අංක 95,
ඩිංගිරියාදෙනිය,
පොල්වත්ත,
කටුගස්තොට.

05-322

එල්ඒඑන්ඩී/එම්පී/2291.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ගල්හින්න නව සේවා ජලාශය ඉදිකිරීම සඳහා මෙම ඉඩම් කොටස අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් , මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1047.

*උපලේඛනය*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 525 - කෝවිල මුදුන ග්‍රාම නිලධාරී වසමේ ගල්හින්න ගමේ පිහිටි දොඩම්ගස්හින්න වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 23.7ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පී. එම්. එස්. ඉම්ටියාස් හිමිකම් කියන කෝවිල මුදුන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | පී. එම්. එස්. ඉම්ටියාස් හිමිකම් කියන කෝවිල මුදුන ඉඩම හා එම්. එච්. එම්. පයිසාල් හිමිකම් කියන කෝවිල මුදුන ඉඩම ; |
| *දකුණට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අත්කර ගත් ඉඩම, එම්. එච්. එම්. පයිසාල් හිමිකම් කියන කෝවිල මුදුන ඉඩම හා ගල්හින්න සිට කෝවිල මුදුන දක්වා යන පාර ; |
| *බටහිරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අත්කර ගත් ඉඩම, පී. එම්. එස්. ඉම්ටියාස් හිමිකම් කියන කෝවිල මුදුන ඉඩම හා ගල්හින්න -කෝවිල මුදුන පාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. පී. එම්. එස්. ඉම්ටියාස් මහතා,
අංක 243/3, පාසැල් මාවත,
ගල්හින්න.

05-323

---

එල්ඒ/2188.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලය කරගොඩ - උයන්ගොඩ ජල සම්පාදන

ක්‍රමය යටතේ රුහුණුගම නල ළිඳ ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් , මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1026.

*උපලේඛනය*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 317B කරගොඩ - උයන්ගොඩ I නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ රුහුණුගම ගමේ පිහිටි නුගේහේන නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 10ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | නාකන්දපුර පාර ; |
| *නැගෙනහිරට* | : | අනගාරික විහාර පාර ; |
| *දකුණට* | : | වැවේ කුඹුර ඉඩම ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. සොයාගත නොහැක.

05-324

---

එල්ජී/1704

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියට අනුව ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යවරයා වන මා විසින් 2012.07.26 දිනැති හා අංක 1768/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ අංක 08 - 356 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි ඉඩම පිහිටි ගමේ නම "ගල්කඩුවහේන" ලෙස සඳහන් වූවත් එය "පලල්ල" ලෙසද ඉඩමේ නම "පැලවත්තහේන" ලෙස සඳහන් වුවත් එය "ගල්කඩුවහේන" ලෙසද නිවැරදි විය යුතු බව 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/975.

05-325

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.